ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**

# විශේෂ නිවේදනයයි

## 19 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය - අදියර II

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ 19 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවයේ දෙවන අදියර 2026 සැප්තැම්බර් 13 වන දින පැවැත්වීමට නියමිත අතර ඒ සඳහා සහභාගී වන උපාධිලාභීන්ට උපාධි ලෝගුව, හිස්වැසුම, සාටකය සහ ප්‍රවේශපත් නිකුත් කිරීම 2026 සැප්තැම්බර් මස 05 සහ 06 වන දිනයන්හිදී අංක 16, එස්.ඩී.එස්. ජයසිංහ මාවත, කොහුවල යන ලිපිනයෙහි පිහිටි බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේදී සිදු කිරීමට කටයුතු සූදානම් කර ඇත.

**මේ සම්බන්ධයෙන් 2026-08-31 දිනැතිව වෙබ් අඩවිය හරහා ඔබ වෙත දන්වන ලද තොරතුරු සංශෝධනය වී ඇති අතර යාවත්කාලීන වූ සියලු තොරතුරු පහත සබැඳිය (link) වෙත පිවිසීමෙන් ලබාගත හැකිය.**

https://results.external.sjp.ac.lk/cnp2/

**සැලකිය යුතුයි : උපාධි ලෝගු ලබාගැනීමට පැමිණීමේදී උපාධි ප්‍රදානෝත්සව දිනට ඔබට නියමිත සැසිය හා පෙරහැර අංකය දැනුවත්ව පැමිණීම අනිවාර්ය වේ.**

නිල ඡායාරූප ලබාගැනීමට අදාළ තොරතුරු www.external.sjp.ac.lk වෙබ් පිටුවෙහි දැක්වේ.

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2026-09-02

- විමසීම - 011 3485 403/ 011 3132 496
  (සතියේ දිනවල පෙ.ව. 8.30 – ප.ව. 4.15)

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**University of Sri Jayewardenepura**

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**External Degrees and Extension Courses Unit**

# 19 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය - (අදියර II) 2026 සැප්තැම්බර් 13

**උපාධි ලෝගුව, උපාධි සාටකය, හිස්වැසුම හා අදාළ ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම හා නිල ඡායාරූප ලබා ගැනීම.**

ප්‍රිය ශිෂ්‍ය ශිෂ්‍යාවනි,

19 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය (අදියර II) සඳහා උපාධි ලෝගුව, උපාධි සාටකය, හිස්වැස්ම හා අදාළ ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමට අදාළව ඔබට දැනුම් දී ඇති නියමිත දිනට සහ වේලාවට පහත සඳහන් ලිපිනයට පැමිණෙන ලෙස දන්වා සිටිමි. එදින උපාධි ලෝගුව, උපාධි සාටකය, හිස්වැස්ම, ප්‍රවේශපත් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් ලබා දෙනු ලැබේ.

ඒ අනුව ඔබට නියමිත දින නියමිත වේලාවට පමණක් පැමිණිය යුතු අතර එදින ඔබගේ ජාතික හැඳුනුම්පත, ශිෂ්‍ය වාර්තා පොත ද රැගෙන එන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

**පැමිණිය යුතු ස්ථානය :** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය,
නො. 16,
එස්.ඩී.එස්. ජයසිංහ මාවත,
කොහුවල, නුගේගොඩ.

**සැ.යු. :**

**උපාධිලාභියා හැර වෙනත් අයෙකු උපාධි ලෝගුව, උපාධි සාටකය, හිස්වැස්ම හා අදාළ ප්‍රවේශපත්‍ර ලබාගැනීමට පැමිණෙන්නේ නම් පහත ඇති අයඳුම්පත සම්පූර්ණ කර රැගෙන ආ යුතුය.**

* **නිල ඡායාරූප ලබා ගැනීම**

19 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවයේ (අදියර II) නිල ඡායාරූප ලබා ගැනීම සඳහා ස්ටූඩියෝ ලක්දම් (පුද්ගලික) සමාගම තෝරාගෙන ඇති අතර එම ආයතනය විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පහත සඳහන් පරිදි වේ.

<table>
<tr><th rowspan="4">Bidder No.</th><th rowspan="4"></th><th colspan="4">Price for photograph with printed mount</th></tr>
<tr><th rowspan="2">Hardcopy with mount<br>12" X 15" or 15" X 12"<br>(W x H)<br>(Photograph should be<br>10" X 12" or 12" X 10")</th><th colspan="2">Soft Copy</th><th>DVD</th></tr>
<tr><th>One edited photo (Excluding storage media)</th><th>Storage Media</th><th></th></tr>
<tr><th>Rs</th><th>Rs</th><th>Rs</th><th>Rs</th></tr>
<tr><td>02</td><td>Without VAT</td><td>1500.00</td><td>Free</td><td>Free</td><td>Free</td></tr>
</table>

* ඡායාරූප මෘදු පිටපත (Soft Copy) හා සැසියේ වීඩියෝ පටය සබැඳියක් (Link) ඔස්සේ බාගත කිරීමට අවස්ථාව නොමිලේ ලබා දේ. එම මෘදු පිටපත (Soft Copy) CD / DVD තැටියක ගබඩා කර ලබා ගැනීම අවශ්‍ය නම් පමණක් මුදල් ගෙවා ලබා ගත හැක.

| Price for Hardcopy of Type 02 Photograph | with tax Rs. |
|---|---|
| 16" x 24" or 24" x 16" (Size with mount) | **2,500.00** |

| | |
|---|---|
| Maximum currier charge for delivering orders within the country | **800.00** |

උපාධි ලෝගුව,සාටක හා හිස්වැසුම නිකුත් කරන **2026 සැප්තැම්බර් මස 05 සහ 06** යන දිනයන්හිදී ස්ටූඩියෝ ලක්දම් (පුද්ගලික) සමාගමේ නියෝජිතයන් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකක පරිශ්‍රයේ රැඳී සිටින අතර එදිනට ඔබට අවශය ඡායාරූප සඳහා වන අත්තිකාරම් ගෙවීම් සිදු කල යුතුය. ඔබගේ කැමැත්ත පරිදි ඡායාරූප ලබාගැනීම් සම්බන්ධයෙන් එම නියෝජිතයන් සමග සාකච්ඡා කල හැකි ය. බාහිර ආයතයක් වන ස්ටූඩියෝ ලක්දම් (පුද්ගලික) සමාගම සමඟ සුහදව කටයුතු කිරීමට වග බලාගත යුතුය.

**විමසීම් -** ස්ටූඩියෝ ලක්දම් (පුද්ගලික) සමාගම



නියෝජ්‍ය ලේඛකාධිකාරී,
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒ්කකය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

# 19 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවය (අදියර II)
# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**උපාධිලාභියා හැර වෙනත් අයෙකු උපාධි ලෝගුව /සාටකය / හිස් වැසුම සහ ප්‍රවේශ පත්‍ර ලබා ගන්නේ නම් පහත කරුණු සම්පූර්ණ කළ යුතුය.**

**උපාධිලාභියාගේ තොරතුරු**

1. උපාධිලාභියාගේ නම - ......................................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය - ......................................................................
3. දුරකථන අංකය - ......................................................................

**උපාධිලාභියා වෙනුවට උපාධි ලෝගුව භාර ගැනීමට පැමිණෙන්නාගේ තොරතුරු**

1. භාරගන්නා අයගේ නම - ......................................................................
2. ජාතික හැඳුනුම්පත් අංකය - ......................................................................
3. දුරකථන අංකය - ......................................................................

❖ උපාධිලාභියාගේ කැමැත්ත සහිත ලිපිය අමුණා ඇත/ නැත

ඉහත නම් සදහන් උපාධිලාභියාට හිමි 19 වන බාහිර උපාධි ප්‍රදානෝත්සවයට (අදියර II) සහභාගී වීම සඳහා ලබා දෙන උපාධි ලෝගුව / සාටකය / හිස් වැසුම සහ ප්‍රවේශ පත්‍ර ...................................................................................... යන මා විසින් ලබා ගන්නා අතර මෙහි සියල්ලේම සම්පූර්ණ වගකීම මා සතු වන බව මෙයින් ප්‍රකාශ කරමි.

| | |
|---|---|
| ............................................................ | .................................. |
| අත්සන | දිනය |

---

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

පරීක්ෂා කර උපාධි ලෝගුව / සාටකය / හිස් වැසුම සහ ප්‍රවේශ පත්‍ර ඉහත නම් සඳහන් භාරකරුට භාර දුනිමි.

| | |
|---|---|
| ............................................................ | .................................. |
| අත්සන | දිනය |